සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

නව නිර්දේශය/புதிய பாடத்திட்டம்/New Syllabus

NEW

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

45 S I, II

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2017 දෙසැම්බර්
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2017 டிசெம்பர்
General Certificate of Education (Ord. Level) Examination, December 2017

භරත නැටුම් I, II
பரத நாட்டியம் I, II
Bharatha Dancing I, II

පැය තුනයි
மூன்று மணித்தியாலம்
*Three hours*

## භරත නැටුම් I

**සැලකිය යුතුයි :**

* **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
* අංක **1** සිට **40** තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) යන පිළිතුරුවලින් **නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ** පිළිතුර තෝරා ගන්න.
* **ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ ( X ) ලකුණ යොදන්න.**
* එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා පිළිපදින්න.

**1.** දෑතින් ම කබිත්ත හස්තම් පෙන්වීම මගින් දැක්වෙනුයේ,
(1) ශිව දෙවියන් ය. (2) ගණ දෙවියන් ය. (3) බ්‍රහ්මා ය. (4) විෂ්ණු දෙවියන් ය.

**2.** මිස්‍රසාපු තාලය වන්නේ කුමක් ද?
(1) තකිට තකදිමි (2) තක තකිට (3) තකිට (4) තකදිමි තක තකිට

**3.** 14 වන සම්යුද හස්තම වන්නේ,
(1) සංගු ය. (2) සම්පුඩම් ය. (3) සකටම් ය. (4) සක්කරම් ය.

**4.** තිස්‍රජාති අඩ තාලම් දැක්වෙන සංකේත වන්නේ කුමක් ද?
(1) $|_4 |_4$ O O (2) $|_3$ O $|_3 |_3$ (3) $|_3$ O $|_3$ (4) $|_3 |_3$ O O

**5.** පාත්තිර ප්‍රාණනයෙහි 'වසෝ' යනු,
(1) බුද්ධියයි. (2) ගායන කුසලතාවයි.
(3) නිවැරදි උච්චාරණයයි. (4) දෘෂ්ටියයි.

**6.** නයාගේ ගමන් විලාසයට සමානව ගෙල ඉහළට හා පහළට හැරවීම,
(1) සුන්දරී වේ. (2) පිරකම්පිතා වේ.
(3) තිරෛච්චීනා වේ. (4) පරිවර්තිතා වේ.

**7.** භරත නැටුම්වල දී අත්‍යවශ්‍ය වන සම්වාද්‍ය භාණ්ඩයක් වන්නේ,
(1) මෘදංගය ය. (2) දවුල ය. (3) තබ්ලාව ය. (4) කෙංචිරා ය.

**8.** අර්ධචන්ද්‍ර හස්තම් දෙකක් එකට සම්බන්ධ කරන විට බිහිවන සම්යුද හස්තම වන්නේ,
(1) කට්වා ය. (2) ගරුඩ ය. (3) අවකිත්තම් ය. (4) කර්ක්කඩහම් ය.

**9.** "තෙයි තෙයි තත්තා" අඩව්ව පිහිටා ඇති තාලය,
(1) රූපකම් ය. (2) මට්ටියම් ය. (3) ඒහම් ය. (4) ආදි ය.

**10.** අඩව් රැසක් එකතු වූ විට,
(1) ජදි නම් වේ. (2) තීර්මානම් නම් වේ. (3) කෝර්වෙ නම් වේ. (4) අරුදි නම් වේ.

[දෙවැනි පිටුව බලන්න.

**11.** 'අට්ටම්' යනු,
(1) ගෙල මගින් පෙන්වන අභිනයයි.
(2) ඇස්වලින් පෙන්වන අභිනයයි.
(3) අත්වලින් පෙන්වන අභිනයයි.
(4) පාවලින් පෙන්වන අභිනයයි.

**12.** රාජ වාදන භාණ්ඩය ලෙස හැඳින්වෙන්නේ,
(1) මෘදංගය ය. (2) බම්බෙ ය. (3) දවුල ය. (4) උඩැක්කිය ය.

**13.** විෂ්ණු දෙවියන් සෝමහාසුරන් විනාශ කර දැමූයේ කුමන අවතාරයකින් ද?
(1) කූර්මම (2) මත්ෂ්‍ය (3) වරාහම (4) නරසිම්මම

**14.** එක් කොටසක් ලෙස අනුතුරුදම් ඇතුළත් වන තාලය කුමක් ද?
(1) තුරුව තාලය (2) මට්ටිය තාලය (3) අඩ තාලය (4) ජම්බෙ තාලය

**15.** ජතිස්වරම්හි මෙයි අඩව්ව ආරම්භ වන්නේ,
(1) අට්ටම්වල අවසානයට ය.
(2) අනුපල්ලවියෙහි අවසානයට ය.
(3) තීර්මානම්හි අවසානයට ය.
(4) සරණම්හි අවසානයට ය.

**16.** මාධවීගේ නැටුම් වර්ග එකොළහ පැවතියේ,
(1) සංග යුගයේ දී ය.
(2) පල්ලව යුගයේ දී ය.
(3) චෝල යුගයේ දී ය.
(4) සංගමරුවිය යුගයේ දී ය.

**17.** 'මෘදු සම්බාහනයක්' කරන අයුරින් අභිනයෙන් කර පෙන්වන සම්යුද හස්තම් වන්නේ,
(1) කපෝතම් ය.
(2) කර්කටහම් ය.
(3) කඩකාවර්ත්තනම් ය.
(4) කර්ත්තරීස්වස්තිකම් ය.

**18.** ලෝකය ආරක්ෂා කිරීම සඳහා දෙවියන් විසින් නටන ලද්දේ,
(1) මුනි තාණ්ඩවම් ය.
(2) සම්හාර තාණ්ඩවම් ය.
(3) තිරිපුර තාණ්ඩවම් ය.
(4) සන්දියා තාණ්ඩවම් ය.

**19.** පඤ්චපානම්වලින් ආදර හැඟීම් නිසා ලේ නහර කොළ පාට වන්නේ කුමන මල් හීසර වැදීමෙන් ද?
(1) නෙලුම් (2) අඹ (3) අශෝක (4) සමන් පිච්ච

**20.** තෝඩයම්, පුරප්පාඩු, පදිංච ආට්ටම් වැනි උරුප්පඩි දක්නට ලැබෙන ශාස්ත්‍රීය නැටුම වන්නේ,
(1) කථකලි ය. (2) භරත ය. (3) කථක් ය. (4) ඔඩිසි ය.

**21.** රෞද්‍ර රසයට විරුද්ධ රසය වන්නේ,
(1) අද්භුත රසය ය. (2) හාස්‍ය රසය ය. (3) භයානක රසය ය. (4) වීර රසය ය.

**22.** ශිව දෙවියන්ගේ අතෙහි තිබෙන උඩැක්කිය,
(1) විශාල උඩැක්කියකි. (2) පළල් උඩැක්කියකි. (3) කුඩා උඩැක්කියකි. (4) දිග උඩැක්කියකි.

**23.** නට්ටුවාංග තාලයේ තාලම් අල්ලා සිටින දකුණු අතේ කබිත්තම් මගින් පෙන්නුම් කරනු ලබන්නේ,
(1) බ්‍රහ්මා ය.
(2) විෂ්ණු ය.
(3) ලක්ෂ්මී ය.
(4) සරස්වතී ය.

**24.** ඇඳුම් සහ ආභරණවලින් දක්වන්නේ,
(1) ආංගික අභිනයයි.
(2) ආහාර්ය අභිනයයි.
(3) වාචික අභිනයයි.
(4) සාත්වික අභිනයයි.

**25.** ආදර රසය මුල් කර ගනිමින් නටන්නේ,
(1) වසන්දන් කුත්තු ය.
(2) මහුඩි කුත්තු ය.
(3) වඩමෝඩි කුත්තු ය.
(4) තෙන්මෝඩි කුත්තු ය.

[තුන්වැනි පිටුව බලන්න.

**26.** "කෝල්හලෙල අඩිත්තු ආඩුංගඩි..." යන ගීතය ගායනා කරමින් නටන ගැමි නැටුම
(1) කෝලාට්ටම් ය. (2) කාවඩි ය. (3) කුම්මි ය. (4) කරහම් ය.

**27.** භාවනා කිරීම පෙන්නුම් කරනු ලබන ද්‍රෂ්ටි භේදම් වන්නේ,
(1) උල්ලෝකිතම් ය. (2) ශාසි ය. (3) නිමීලිතම් ය. (4) අනුවිරුත්තම් ය.

**28.** අක්ෂර දොළහක් අඩංගු වන තාල මොනවා ද?
(1) තිස්‍රජාති තුරුවම්, කණ්ඩජාති තිරුපුටෙ (2) කණ්ඩජාති අඩ, මිස්‍රජාති රූපකම්
(3) සංකීර්ණ ජාති මට්ටියම්, තිස්‍රජාති ජම්පෙ (4) සතුස්‍රජාති අඩ, කණ්ඩජාති මට්ටියම්

**29.** කණ්ඩිගෙවලින් නිර්මාණය කරන ලද උරුප්පඩිය
(1) තිල්ලානා ය. (2) අෂ්ටපති ය. (3) ජාවලි ය. (4) පදම් ය.

**30.** ජාති හස්තම්වලින් වෛදිකයන් පෙන්නුම් කිරීමට භාවිත කරනු ලබන හස්තම් වන්නේ,
(1) දකුණු අතේ කඩකාමුඛම් සහ වම් අතේ කම්සාසියම් ය.
(2) දකුණු අතේ සිකරම් සහ වම් අතේ සිකරම් ය.
(3) දකුණු අතේ සිකරම් සහ වම් අතේ පතාකම් ය.
(4) දකුණු අතේ සකඩම් සහ වම් අතේ සකඩම් ය.

**31.** නාට්‍ය කව්චේරිවල ශබ්දම්වලට පසුව එන උරුප්පඩිය,
(1) ජතීස්වරම් ය. (2) වර්ණම් ය. (3) කීර්තනෙ ය. (4) තිල්ලානා ය.

**32.** මෝහිණී නැටුම්වල භාවිත වන ප්‍රධාන සංගීත භාණ්ඩය,
(1) දවුල ය. (2) උඩැක්කිය ය. (3) ඩොල්කිය ය. (4) සුත්ත මද්දලම් ය.

**33.** වම් අතේ සිකරම් හා දකුණු අතේ කර්ත්තරීමුඛම් භාවිත කර පෙන්නුම් කරන පාන්දව්‍ය හස්තම් වන්නේ,
(1) නැන්දා ය. (2) මාමා ය. (3) මස්සිනා ය. (4) නෑනා ය.

**34.** කුකුළා, කොකා සහ කපුටා යනාදිය පෙන්නුම් කිරීමට භාවිත කරන අසම්යුද හස්තම් වන්නේ,
(1) තාම්‍රසූඩම් ය. (2) මුකුලම් ය.
(3) පිරමරම් ය. (4) සතුරම් ය.

**35.** සභා ලක්ෂණවල විශාරදයින් සංසන්දනය කරන්නේ,
(1) අතුවලට ය. (2) බමරුන්ට ය. (3) මල්වලට ය. (4) පලතුරුවලට ය.

● අංක **36** සිට **40** තෙක් එක් එක් ප්‍රශ්නයේ හිස්තැනට ගැළපෙන පිළිතුර තෝරන්න.

**36.** වයලීන් වාදනය කිරීම සම්බන්ධයෙන් මුලින් ම ප්‍රසිද්ධියට පත් වූයේ ................................ ය.
(1) ඩී. එන්. ස්වාමිනාදපිල්ලෙ (2) වඩිවේලු පිල්ලෙ
(3) තනම්පාල් (4) කාරයික්කුඩි සාම්බසිවම්

**37.** තංජෛ මහා දේවාලය නිර්මාණය කරන ලද ප්‍රධාන ශිල්පියා ................................ ය.
(1) රාජ රාජ චෝළ (2) මහේන්ද්‍ර වර්මන්
(3) පාණ්ඩියන් (4) කුංජරමල්ලන්

**38.** "භරත කුල පාක්‍ය කලිකේ" යනුවෙන් ආරම්භ වන ශ්ලෝකම් ........................... ය.
(1) අරංගදේවදාසස්තුති (2) පුෂ්පාංජලි ස්තුති (3) ගුරු වනක්කම් (4) සබෙ වනක්කම්

**39.** බටනලාවේ සිදුරු ............................ ලෙස ද හැඳින්වේ.
(1) තාරරන්ද්‍රම් (2) බට ලී (3) වේනු (4) මුකරන්ද්‍රම්

**40.** චෙන්නායි සංගීත විත්ව සභාව විසින් "සංගීත කලානිධි" උපාධිය ........................... මහතාට ප්‍රදානය කරන ලදී.
(1) මීනාට්සි සුන්දරම්පිල්ලෙ (2) ක. පොන්නයියා පිල්ලෙ
(3) වලුවූර් රාමයියාපිල්ලෙ (4) ගෝපාල ක්‍රිෂ්ණ භාරදියාර්

* *

|හතරවැනි පිටුව බලන්න.

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

නව නිර්දේශය/புதிய பாடத்திட்டம்/New Syllabus

NEW

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

45 S I, II

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2017 දෙසැම්බර්
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2017 டிசெம்பர்
General Certificate of Education (Ord. Level) Examination, December 2017

භරත නැටුම් I, II
பரத நாட்டியம் I, II
Bharatha Dancing I, II

## භරත නැටුම් II

* **පළමුවැනි** ප්‍රශ්නය හා අනෙකුත් ප්‍රශ්නවලින් **හතරක්** ද තෝරාගෙන ප්‍රශ්න **පහකට** පමණක් පිළිතුරු සපයන්න.

**1.** පහත සඳහන් ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.
(i) සංකීර්ණ නඩෛවලට අදාළ සොට්කට්ටුව කුමක් ද?
(ii) කංගානිවරු හා කනක්කපුල්ලේවරු යන අය මුල් කරගෙන නටන ගැමි නැටුම් මොනවා ද?
(iii) "0" ලෙස දැක්වෙන සංකේතයේ නම කුමක් ද?
(iv) 'කපුටා' වාහනය ලෙස යොදාගෙන ඇති දෙවියන් දැක්වීමට භාවිත කරන්නේ කුමන හස්තම ද?
(v) මල්වලින් අංජලි පුදමින් නටන නැටුම කුමක් ද?
(vi) අට්පුද රසම්හි ස්ථායි භාවම් ලියන්න.
(vii) කුච්චිපුඩි නැටුම් අයත් වන්නේ කුමන ප්‍රාන්තයට ද?
(viii) අලවයූර් දක්ෂිණාමූර්ති සහ ඉනුවිල් සින්නරාජා යන අය වාදනය කළ භාණ්ඩය කුමක් ද?
(ix) නිරුත්ත උරුප්පඩියට උදාහරණ **දෙකක්** ලියන්න.
(x) ඇතිත් ම මුෂ්ටි හස්තම් භාවිත කර අභිනයෙන් පෙන්වන දසඅවතාර සහ නවග්‍රහ හස්තම් නම් කරන්න.

**2.** (i) භරත නාට්‍ය කච්චේරිවල දී ප්‍රථමයෙන් නටන උරුප්පඩියේ රාගය සහ තාලය ලියන්න.
(ii) ඉහත (i) හි සඳහන් උරුප්පඩියේ ලක්ෂණ ලියන්න.
(iii) ඉහත (i) හි සඳහන් උරුප්පඩියේ තීර්මානම් කොටසේ සිට අග දක්වා සංගීත සංකේත මගින් දක්වන්න.

**3.** (i) ඉන්දීය ශාස්ත්‍රීය නැටුම් වර්ග **හතරක්** නම් කරන්න.
(ii) පහත සඳහන් කරුණු ඇසුරින් ඉන්දීය නැටුම්වල කථක් නැටුම් පිළිබඳව ලියන්න.
- උපත
- වර්ධනය
- එහි දියුණුවට කටයුතු කළ පුද්ගලයින්
- ඇඳුම් හා ආභරණ
- භාවිත කරන ප්‍රධාන සංගීත භාණ්ඩය

**4.** පහත සඳහන් හස්තම්වලට අදාළ විනියෝග, ඒවායේ ශ්ලෝක හා අර්ථ සමග ලියන්න.
(i) කඩකාමුඛම් (ii) චන්ද්‍රකලා
(iii) සම්පුඩම් (iv) ඩෝලම්

**5.** වලුවූර් රාමයියාපිල්ලෙ පිළිබඳ විස්තරයක් ලියන්න.

**6.** පහත සඳහන් ඒවා පිළිබඳව කෙටි සටහන් ලියන්න.
(i) කෝර්වෛ (ii) පාත්තිර පිරාණන් (iii) වාත්සල්‍ය භාවම්

**7.** (i) ගැමි නැටුම් අතුරින් කාවඩි නැටුම් පිළිබඳව පහත සඳහන් කරුණු ඇසුරින් පැහැදිලි කරන්න.
- හැඳින්වීම
- නැටුම් වර්ග
- ගීත වර්ග
- ඇඳුම් හා ආභරණ
- භාවිත කරන සංගීත භාණ්ඩ

(ii) ඔබ නරඹා ඇති කාවඩි නැටුමක දක්නට ලැබුණු හොඳ ලක්ෂණ හා අඩුපාඩු සඳහන් කර, එම අඩුපාඩු මගහරවා ගැනීමට සුදුසු යෝජනා ඉදිරිපත් කරන්න.

***